# පොලිස්පති නිල කාර්යාලය

ආර්ටීඑම් : ( 1129 )

2020.10.31

පොලිස්පති ගෙන්

සියලු ම : ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන්
: නියෝජ්‍ය පොලිස්පතිවරුන්
: අණදෙන නිලධාරීන් / අධ්‍යක්ෂවරුන්
: කොට්ඨාස භාර නිලධාරීන්
: දිස්ත්‍රික් භාර ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිවේදිත නිලධරයන්
: මූ.පො.ප. / ස්ථානාධිපතිවරුන්

CRTM
582

**නිරෝධායන ඇඳිරි නීතිය පනවා ඇති කාලය තුළ විවෘත කිරීම සඳහා අවසර දී ඇති අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල, අධිකාරී සහ ආයතන වල සේවකයන්ගේ රාජකාරි හැඳුනුම්පත ඇඳිරි නීති බලපත්‍ර ලෙස භාවිත කිරීමට අවසර ලබාදීම**

ඇඳිරි නීති බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් තීරණය කිරීම සඳහා පළාත් භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන් වෙත බලය පැවරීම සම්බන්ධයෙන් 2020.10.28 දිනැතිව නිකුත් කරන ලද RTM 1052 හි සඳහන් උපදෙස්වලට වැඩිමනක් වශයෙනි.

2. රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන Covid 19 වෛරස් ව්‍යාප්තිය වැළැක්වීමේ වැඩ සටහන් හා සමගාමී ව අනෙකුත් රාජ්‍ය සේවා ද බාධාවකින් තොර ව පවත්වාගෙන යාම සඳහා ඉදිරි කාලයේ දී කටයුතු කළ යුතු ආකාරය සඳහන් කරමින් රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් විසින් 2020.10.28 දිනැති ව රා.ප.ච. 20/2020 දරණ චක්‍රලේඛය නිකුත් කර ඇත.

3. එසේ ම එකී චක්‍රලේඛයෙහි සඳහන් උපදෙස් පරිදි Covid 19 වෛරස් ව්‍යාප්තිය පාලනය කිරීම සඳහා අනුගමනය කළ යුතු උපදෙස් ඇතුළත් කරමින් ජනාධිපති ලේකම් විසින් 2020.04.18 දිනැති අංක PS/GPA/චක්‍රලේඛ/20/2020 දරණ චක්‍රලේඛය සහ 2020.05.14 දිනැති අංක FS/GPA/චක්‍රලේඛ/ 21/2020 දරණ චක්‍රලේඛය වෙත අවධානය යොමු කර එහි සඳහන් උපදෙස් පරිදි නිලධරයන් සේවයට කැඳවීම සහ ආයතන පවත්වාගෙන යාම සිදු කළ යුතු බවට ද දන්වා ඇත.

4. ඒ අනුව ඉහත පරිදි කටයුතු කිරීම සඳහා නිරෝධායන ඇඳිරි නීතිය පනවා ඇති ප්‍රදේශයන්හි සිට පහත සඳහන් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල, අධිකාරි සහ ආයතන වල සේවකයන් සඳහා තම රාජකාරී / සේවා හැඳුනුම්පත ඇඳිරි නීති බලපත්‍රයක් ලෙස භාවිත කරමින් සේවය සඳහා පැමිණීමට අවසර දිය යුතු ය.

- ❖ ජනාධිපති කාර්යාලය
- ❖ අග්‍රාමාත්‍ය කාර්යාලය
- ❖ අධිකරණ අමාත්‍යාංශය
- ❖ නීතිපති දෙපාර්තමේන්තුව
- ❖ ආරක්ෂක අමාත්‍යාංශය
- ❖ අපනයන සංවර්ධන මණ්ඩලය
- ❖ අභ්‍යන්තර වෙළඳ, ආහාර සුරක්ෂිතතා සහ පාරිභෝගික සුභසාධක අමාත්‍යාංශය
- ❖ අමාත්‍ය මණ්ඩල කාර්යාලය
- ❖ ආගමන හා විගමන දෙපාර්තමේන්තුව
- ❖ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ස්ථාපිත කොමිෂන් සභා
- ❖ ආයුර්වේද දෙපාර්තමේන්තුව
- ❖ ආයෝජන මණ්ඩලය
- ❖ ආහාර දෙපාර්තමේන්තුව
- ❖ කම්කරු දෙපාර්තමේන්තුව
- ❖ කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය
- ❖ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
- ❖ කෘෂිකර්ම අමාත්‍යාංශය
- ❖ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
- ❖ ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
- ❖ ගිනි නිවීම් සේවා දෙපාර්තමේන්තුව
- ❖ ගුවන් තොටුපල හා ගුවන් සේවා සමාගම
- ❖ ගොවිජන සේවා දෙපාර්තමේන්තුව
- ❖ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව
- ❖ ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය
- ❖ ජාතික ජලජ සම්පත් සංවර්ධන අධිකාරිය (NARRDA)
- ❖ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය
- ❖ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය
- ❖ ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව
- ❖ දිස්ත්‍රික් ලේකම් කාර්යාල
- ❖ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
- ❖ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව (DFAR)
- ❖ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය
- ❖ පළාත් ආණ්ඩුකාර කාර්යාලය
- ❖ පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය
- ❖ පාරිභෝගික සේවා අධිකාරිය
- ❖ ප්‍රාදේශීය ලේකම් කාර්යාල
- ❖ මුදල් අමාත්‍යාංශය
- ❖ රජයේ මුද්‍රණාලය
- ❖ රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව
- ❖ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
- ❖ ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව
- ❖ ලංකා ආයෝජන මණ්ඩලය
- ❖ ලංකා ධීවර වරාය සංස්ථාව (CFHC)
- ❖ ලංකා ධීවර සංස්ථාව (CFC)
- ❖ ලංකා නැව් සමාගම
- ❖ ලංකා විදුලි පෞද්ගලික සමාගම
- ❖ ලංකා විදුලිබල මණ්ඩලය
- ❖ ලංකා සතොස ලිමිටඩ්
- ❖ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
- ❖ වනජීවී දෙපාර්තමේන්තුව
- ❖ වාරිමාර්ග දෙපාර්තමේන්තුව
- ❖ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
- ❖ විදේශ කටයුතු අමාත්‍යාංශය

- විභාග දෙපාර්තමේන්තුව
- ශ්‍රී ලංකන් ගුවන් සමාගම
- ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය
- ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම
- ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුව
- ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව
- ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
- ශ්‍රී ලංකා ප්‍රමිති කාර්යාංශය
- ශ්‍රී ලංකා බන්ධනාගාර දෙපාර්තමේන්තුව
- ශ්‍රී ලංකා මහබැංකුව
- ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය
- ශ්‍රී ලංකා රේගුව
- ශ්‍රී ලංකා වරාය අධිකාරිය
- සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
- සමූපකාර තොග වෙළෙඳ සංස්ථාව
- සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
- සියලුම මාධ්‍ය ආයතන
- සියලු ම පළාත් පාලන ආයතන
- සියලු ම පෞද්ගලික රෝහල්
- සියලු ම මාධ්‍ය සේවා ආයතන
- සියලු ම රක්ෂණ සමාගම
- සියලු ම රාජ්‍ය හා පෞද්ගලික බැංකු
- සියලු ම විදේශ කානාපති කාර්යාල
- සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව
- සීමාසහිත ලංකා ඛනිජ තෙල් ගබඩා පර්යන්තය
- සීමාසහිත මිල්කෝ පෞද්ගලික සමාගම
- පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
- සෞඛ්‍ය අමාත්‍යාංශය
- සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
- සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
- සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව

(ඉහත දක්වා ඇති ආයතන ලැයිස්තුව අවශ්‍යතාවය අනුව වරින් වර සංශෝධනය විය හැකිය.)

5. එසේ වුව ද සේවා අවශ්‍යතාවයක් නොමැති ව ඇඳිරි නීති කාලය තුළ තම සේවා හැඳුනුම්පත අවභාවිත කරමින් නිරෝධායන රීතිවලට පටහැනිව කටයුතු කරන තැනැත්තන් සඳහා 2020.10.16 දිනැති RTM 621 (CRTM 328) හි සඳහන් උපදෙස්වලට යටත් ව නීති මඟින් කටයුතු කිරීමට ද අවශ්‍ය පියවර ගත යුතු ය.

6. මෙයට අමතරව එක් එක් පළාතේ සෞඛ්‍ය තත්ත්වයන් අනුව තම පළාත තුළ ඖෂධ ඇතුළු අත්‍යවශ්‍ය ආහාර බෙදාහැරීම සහ සේවාවන් පවත්වාගෙන යාම, කෘෂි නිෂ්පාදන හා පශු සම්පත් නිෂ්පාදනය, අපනයන භෝග වගාව හා නිෂ්පාදන කටයුතු, ගොවිතැන් කටයුතු හා ඒ ආශ්‍රිත දෛනික අත්‍යවශ්‍ය වෙනත් කටයුතු පවත්වාගෙන යාම සම්බන්ධව ප්‍රදේශයේ පළාත් ලේකම්, දිස්ත්‍රික් ලේකම්වරුන්, සෞඛ්‍ය අංශ සහ අනෙකුත් රාජ්‍ය නිලධරයන් සමඟ සම්බන්ධීකරණය වී සුදුසු පරිදි අවසර ලබාදීම පිළිබඳව ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන් විසින් තීරණය කළ යුතු ය.

7. සාමාන්‍ය මහජනතාව සහ පොලිස් නිලධරයන් මුණගැසෙන ආකාරයේ රාජකාරී හැකිතාක්දුරට අවම කළ යුතු බැවින් පොලිස් ස්ථාන මඟින් ඇඳිරි නීති බලපත්‍ර නිකුත් කිරීම උපරිම වශයෙන් සීමා කර, ඒ වෙනුවට විකල්ප ක්‍රම හරහා ඉහත පරිදි සේවාවන් පවත්වාගෙන යාම සම්බන්ධ ක්‍රමවේදයන් දිසා භාර නියෝජ්‍ය පොලිස්පතිවරුන්, කොට්ඨාස භාර නිලධාරීන් සමඟ සාකච්ඡා කර ක්‍රියාත්මක කිරීමට ද කටයුතු කළ යුතු ය.

8. මේ සම්බන්ධයෙන් ඔබ යටතේ රාජකාරි කරනු ලබන සියලු ම නිලධරයන්ට දැනුවත් කිරීමට කටයුතු කරන්න.

සී.ඩී. වික්‍රමරත්න
වැඩබලන පොලිස්පති

සී. ඩී. වික්‍රමරත්න
වැඩ බලන පොලිස්පති

පිටපත : ගොනුවට

ම-/-